**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වූ මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,මෙම වාර්තාවේ ඇතුලත් මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාව නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බවට ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------ | ---------- | --------------------------------- |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ඊගල්ස් බේ විව් නිවාඩු නිකේතනය, ඊගල්ස් ලැගුන් විව්, ඊගල්ස් ලේක්සයිඩ් උත්සවශාලාව, මාබල් බීච් නිවාඩු නිකේතනය, කෞතුකාගාරය සහ ගොවිපොළවල් ඇතුළු ආදායම් උපදවන ව්‍යාපෘති මගින් සමාලෝචිත වර්ෂය තුල උපයාගත් ආදායම් ගිණුම්ගතකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම හා අරමුදල් භාවිතය පිළිබඳ ගිණුම් කටයුතු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මානව හා භෞතික සම්පත් යොදාගනිමින් වානිජමය පදනමක් සහිත මෙම ව්‍යාපෘති වල මූල්‍ය කාර්යය සාධනය පිලිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කල යුතුය. | මේවා මගින් ලබන ආදායම් සුභසාධන කටයුතු සඳහා යොදා ගනු ලබන බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොමැත. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------- | ------------ | ------------------------------- |
| විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 11.58 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ට වැඩි කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු නමුත් ආපසු අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. | ණය ගෙවීම පැහැර හැර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XLVII** පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අයකර ගත හැකි ශේෂ සඳහා සිහිකැඳවීම් යැවීමටද අයකර ගත නොහැකි බවට නිර්දේශ කර ඇති ශේෂ කපා හැරීමට භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ පිටපතක් ලබා දෙන බව දන්වා තිබුණි. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ගුවන් හමුදාපතිතුමා විසින් අවශ්‍ය උපදෙස් ලබාදෙයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ---------- | -------------------------- |
| (අ) | විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 14.24 ක ආදායම් හිඟ හිට තිබුණු අතර එම හිඟ හිටි ආදායම අතුරින් රු.මිලියන 11.73 ක හිඟ ආදායම වර්ෂ 4 ක සිට 15 ක් අතර කාල පරාසයකට අදාල විය. හිඟ හිටි අදායම අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිළධාරීයා කටයුතු කල යුතුය.මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හැර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුව පවතී. | අයකරගත හැකි ශේෂ සදහා සිහි කැදවීම් යැවීමටද අයකර ගත නොහැකි බවට නිර්දේශ කර ඇති ශේෂ කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට භාණ්ඩාගාරය වෙත යොමුකර ඇත. |
| (ආ) | 2015 වර්ෂයේ ගුවන් යානා කුළී ආදායම රු.මිලියන 246.3 ක් වූ අතර එම ආදායම ක්‍රමයෙන් පිරිහෙමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේදි එය රු.මිලියන 74.57 ක් දක්වා සියයට 49 කින් පහළ ගොස් තිබුණි. | පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව ගුවන් යානා කුළී ආදායම ප්‍රමාණාත්මක මට්ටමකින් අඩුවීමට බලපෑ හේතු සොයා බලා ඒවා නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගැනීමෙන් මේ සම්බන්ධ ව්‍යාපාර කටයුතු වල තරඟකාරීත්වයට මුහුණ දීමට ආයතනය කටයුතු කල යුතුවේ. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු වාණිජ හෙවත් මෙහෙයුම් සිදුකල හැකි ගුවන් යානා ප්‍රමාණය සහ ඒවායේ ගුණත්වය පහල වැටීම මත වාණිජ ගුවන් මෙහෙයුම් සීමා කිරීම හේතු වී ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් මදැක්වී |
|---|---|---|---|
| | -------------------- | ------------------ | --------------------------------- |
| (අ) | නිසි අධ්‍යානයකින් සහ අවශ්‍යතා හරිහැටි හඳුනා ගැනීමෙන් අනතුරුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත එකී වැඩිපුර වියදම් දැරීම සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් අතර රු.මිලියන 656.8 ක ප්‍රතිපාදන මාරු කිරීමත් පරිපූරක | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු මගින් රු.මිලියන 627.4 ක ප්‍රතිපාදන ලබා ගැනීමටත් සිදුවී තිබුණි. | | |
| (ආ) වැය විෂයයන් 20 ක් සඳහා එකතුව රු.මිලියන 1,585 ක අධි ප්‍රතිපාදන සලසා තිබුනු බව හෙලිදරව් විය. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක පැවතුණි. | - එම - | බිල්පත් ප්‍රමාද වීම, ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, මිලදී ගැනීම් එම වර්ෂය තුලදී සිදුනොවීම, විදේශ රටවල තාක්ෂණ උපදේශ මත කරනු ලබන ගුවන් යානා අලුත්වැඩියා සමාලෝචිත වර්ෂය තුල නිම නොවීම යන කරුණු මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා තිබුණි. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2018 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.මිලියන 788 ක් වූ අතර වැය විෂයන් 21 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජන කල පසු ඉතිරි වූ මුදල ඉක්මවා රු.මිලියන 434 ක් වූ බැරකම්වලට බැදී තිබුණි. . | මු.රෙ. 94 අනුව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී මේ පිළිබඳ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත වූ කාර්යයන් සම්බන්ධයෙන් වෙනත් අමාත්‍යාංශ 03 ක් හා දෙපාර්තමේන්තු 03 ක් විසින් එකතුව රු.මිලියන 1,026 ක මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මාරුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 883 | ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු සොයා බලා නිශ්චිත කාර්යයන්ට උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | රු.මිලියන 143 ක් ඉතිරිවී ඇති බව පිළිගනී. |

ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 143 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගි කර ගනිමින් පෞද්ගලික සමාගමක් වශයෙන් පවත්වාගෙන යනු ලබන හෙලිටුවර්ස් සමාගම 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වසර 9 ක කාලයක් තුල රු.මිලියන 54.5 ක ලාභයක් උපයාගෙන තිබුණු නමුත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකල ආයෝජනයට කිසිදු ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.මෙම සමාගමේ කොටස් අයිතිය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිළධාරීන් 05 දෙනෙකු වෙත පැවරී තිබුණු අතර මහා භාණ්ඩාගාරයට කොටස් හිමිකම ලැබෙන පරිදි සමාගම නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වනතෙක් සම්පූර්ණ කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | සමාගමේ අයිතිය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ඇති අතර එහි තීරණය අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | -------------------------------- |
| (අ) | ගුවන් යානා අමතර කොටස් අළුත්වැඩියා කිරීමට විදෙස් සැපයුම්කරුවන් වෙත යැවීම සඳහා අවශ්‍ය අතරමැදි කටයුතු සිදු නොකිරීම නිසා කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ අපනයන අංශය භාරයේ අළුත්වැඩියා කටයුතු වලට යොදා ගනු ලබන අමතර කොටස් විෂයන් 54 ක් රඳවාගෙන පැවති බව 2019 ජනවාරි 31 දින සිදුකල විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. ඉහත විෂයන් වර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ අපනයන අංශය වෙත ලැබී තිබුණු නමුත් අපනයනය කිරීමට අවශ්‍ය අතරමැදි ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් ඉටු කර ගැනිමට නොහැකිව පැවතුණි. | ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම තුලින් තොග විෂයයන් වලට වන හානි අවම කර ගැනීමටත් ගුවන් යානා අළුත්වැඩියා කටයුතු කඩිනමින් නිම කර ගැනීමටත් කටයුතු කල යුතු වීම. | විදෙස් සැපයුම්කරුවන්ගෙන් සනාථ ලබාගැනීමට අවශ්‍යවීමෙන් මෙවැනි සුළු ටෙන්ඩර් ප්‍රමාණයක් ප්‍රමාද වීමේ සම්භාවිතාවයක් ඇත. |
| (ආ) | 2004 - 2016 කාල සීමාව තුල අළුත්වැඩියා කටයුතු සඳහා විදේශ රටවලට යවා තිබුණු ගුවන් යානා අමතර කොටස් විෂයන් 120 ක් අළුත්වැඩියා කටයුතු නිමවී 2018 දෙසැම්බර් 31 දින වන විටත් නැවත ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය. | අමතර කොටස් ආපසු ලැබීමට ප්‍රමාද වීමෙන් ගුවන් යානා නිෂ්කාර්ය තත්ත්වයට පත්වීම වැලැක්වීම සඳහා කටයුතු කල යුතු වීම. | අමතර කොටස් විෂයයන් 120 ක් ලැබී නොමැති බව පිළිගනී. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | මේ නිලධාරීගේ අදහස් ගණන්දී දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | -------------------------------- |
| (අ) | කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ රෙදි පිළි ගබඩා පරිශ්‍රය තුල 2018 නොවැම්බර් 27 දින වර්ග 9 කට අයත් රු.මිලියන 31.35 ක් වටිනා රෙදි මීටර් 99,615 ක් වර්ෂ 2 කට වැඩි | අවශ්‍යතාවය හඳුනාගනිමින් මිලදී ගැනීම මගින් තොග පාලන ක්‍රියාවලිය ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීම අවශ්‍ය වේ. | 2019 වර්ෂය අවසාන වන විට භාවිතයට ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| කාලයක සිට ඌන උපයෝජිතව පැවති බව භෞතික පරීක්ෂාවේදී හෙළිදරව් විය. | | |
| (ආ) තොග විෂය අංක 8405009034 දරන ෆ්යිල්ඩ් කැප් රන්ක් (Field Cap other Rank) අතුරින් වටිනාකම රු.මිලියන 3.39 තිබූ තොග විෂයයන් 15,555 ක් වර්ෂ 02 ක් තිස්සේ උපයෝජනය නොකර කටුනායක ගබඩාවේ පැවතුනි. | අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට වගබලා ගත යුතු වීම. | 2019 වර්ෂය තුල නිකුත් කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ කාමර අංක 17 හි ගබඩාකර තිබුණු රු. මිලියන 7.9 ක් වටිනා පිහන් බඩු වර්ග 29 ක තොග විෂයයන් 16,813 ක් උපයෝජනය නොකර වර්ෂයකට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | -එම- | විවිධ රාජ්‍ය උත්සව සඳහා බෙදා හැරීමට මෙම විෂයයන් තොගයේ පවතී. |
| ඇ) කටුනායක වාහන අලුත්වැඩියා අංගනයේ ඩිෆෙන්ඩර් රථ 37 ක් සහ වෙනත් වාහන 69 ක් වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | අලුත්වැඩියා කටයුතු සඳහා ඇති බාධාවන් ඉවත්කර ධාවන තත්වයට පත්කර ගත යුතු වීම. | ඩිෆෙන්ඩර් රථ 37 න් 12 ක් මේ වන විටත් අලුත්වැඩියා කර ඇති අතර ඉතිරි ඒවා සම්පූර්ණ අලුත්වැඩියාවන් සිදුකිරීමට කටයුතු යොදා ඇත. |

### 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 අනුව පිළියෙල කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට අනුව වර්ෂ 05 කට අඩු සිද්ධීන් 224 කට අදාල රු.මිලියන 1,105 ක මුදලක්ද වර්ෂ 5ත් 10 ත් අතර සිද්ධීන් 18 කට අදාලව රු.මිලියන 43.13 ක මුදලක්ද වර්ෂ 10 කට වැඩි සිද්ධීන් 35 කට අදාල රු. මිලියන 16.83 ක මුදලක්ද වශයෙන් මුළු | මු.රෙ.105 අනුව කටයුතු කළ යුතු වීම. | අයකර ගැනීමට, කපාහැරීමට, අත්හැරීමට කටයුතු කරමින් පවතින බවට අදහස් දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | සිද්ධින් 277 කට අදාලව රු.මිලියන 1,165 ක්වූ මුදලක් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරිමට ඇති පාඩු ලෙස වාර්තා කර තිබුණි. | | |
| (ආ) | කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරෙහි ගුවන් යානා අමතර කොටස් අංශයේ රේඩාර් රිසිවරයක් සහ ඇන්ටනා ස්කෑනරයක් 2014 අප්‍රේල් 25 වන දින අළුත්වැඩියා කටයුතු සඳහා චීනයට යවා තිබුණු නමුත් ප්‍රවාහනය අතරතුරදී ඉහත භාණ්ඩ අස්ථානගත වීම හේතුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රු.මිලියන 74.46 ක අලාභයක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් 2015 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණු අතර අලාභයේ වටිනාකම, වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන අයකර ගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය. | වගකිව යුතු නිළධාරීන්ගෙන් මෙම අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | මේ වන විට පරීක්ෂණ අධිකරණය මගින් සොයා බලමින් සිටින අතර අදාල නිගමන ඉදිරි කාලයේදී ලබා දීමට කටයුතු කරනු ලැබේ. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------ | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------- |
|---|---|---|---|
| (අ) | 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. | මෙම අරමුදල් ගුවන් හමුදා නියෝග අංක 852 අනුව පිහිටුවා ඇති අතර එම අරමුදල් ගුවන් හමුදා විධායක විගණන අංශය විසින් විගණනය කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | නොවී පැවති බව නිරීක්ෂණය විය. මීට අමතරව, උක්ත අරමුදල් සම්බන්ධව වාර්ෂික විගණන කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධායක විගණන අංශය මගින් සිදුකරනු ලබන බව ගුවන් හමුදාපති වරයා විසින් පැහැදිලි කර තිබුණු නමුත් අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන රත්මලාන ගුවන් හමුදා කඳවුරේ කෞතුකාගාරය මගින් 2018 අප්‍රේල්, මැයි, ජූනි යන මාස තුල ආදායම් මාර්ග 13 කින් උපයා තිබූ ආදායම රු.1,719,826 ක් වී තිබුණි. මෙම මුළු ආදායමෙන් සියයට 10 සිට 20 දක්වා ප්‍රමාණයක් රාජ්‍ය ආදායමට බැර වී තිබුණි. එසේම මෙම ආදායම් රඳවා ගැනීමේ අරමුණ කෞතුකාගාරයේ වියදම් දැරීම වුවද 2018 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල රු.808,267 ක මුදලක් කෞතුකාගාරයේ වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලින් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | රඳවාගත් ආදායම් වලින් කෞතුකාගාරය සම්බන්ධ පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීම මගින් මේ පිළිබඳ මූල්‍ය පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීමට කටයුතු කල යුතු වීම. | ආදායමින් කොටසක් ඒකාබද්ධ අරමුදලට ලබාදෙන අතර අනෙකුත් ආදායම් අරමුදල් වෙත බැරකර හමුදා සාමාජිකයන්ගේ සුභසාධනය සඳහා යොදා ගනු ලබන බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------- | ----------- | -------------------------------- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා ගුවන් හමුදාව දැනුවත් වි නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන, අරමුණු, ඉලක්ක කරා ළගා | අරමුණු හඳුනා ගැනීමට කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී අවශ්‍ය සැලසුම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සංවිධානය කරනු ඇත. |

විය යුතු සන්ධිස්ථානය සහ ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සදහා වන දර්ශකයක්ද හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.